**සී/ස මාන්තායි සෝල්ට් සමාගම - 2016/2017**

------------------------------------------------------

2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සී/ස මාන්තායි සෝල්ට් සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර සමාගමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ කාර්යසාධනය පිළිබඳව මගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS for SMES) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------------------

(අ) චෙම්මනි කර්මාන්තශාලාව (Chemmani Factory) යටතේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන රු.12,100,000 ක් වටිනා ඉඩම සමාගම සතු නොවූ අතර මෙම ඉඩමේ අයිතිය තහවුරු කළ හැකි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමටද සමාගම අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ලුණු ක්ෂේත්‍රයක් (Elephant pass ලුණු ලේවාය) සංවර්ධනය කිරීම වෙනුවෙන් දැරූ රු.5,798,042ක රජයේ ප්‍රාග්ධන ආධාර ප්‍රාග්ධනීත නොකර සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදමක් ලෙස හඳුනාගෙන තිබුණි.

(ඇ) කුඩා හා මධ්‍ය පරිමාණයේ ආස්ථිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල (SLFRS for SMES) 2.36 ඡේදයට පටහැනිව සමාගම එහි පොලී ආදායම් මුදල් පදනමට හඳුනාගෙන තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම සහ 2017 මාර්තු 31 දිනට ලැබිය යුතු පොලී ආදායම රු. 1,928,419 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය විසින් ලුණු ක්ෂේත්‍රය (Elephant pass ලුණු ලේවාය) නවීකරණය කිරීම සඳහා රු.51,242,812 ක ප්‍රාග්ධනීත වැඩ ක්‍රියාත්මක කර තිබූ නමුත් අදාළ ඉඩමේ අයිතිය සමාගමට මාරු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අදාළ මූල්‍ය ප්‍රකාශනයටද ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කරන ලද මතය සඳහා පදනම ඡේදයේ පැහැදිලි කරන ලද කරුණුවලින් විය හැකි බලපෑම හැරුණු විට මාගේ මතය වනුයේ, සී/ස මාන්තායි සෝල්ට් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස පිළිඹිබු කර ඇති බවත් එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වන බවත්ය.

#### 2.1.1 අනෙකුත් නීතිමය හා නියාමන අවශ්‍යතා මත වාර්තා

-------------------------------------------------------------

2007 අංක 7 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ නියමය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිරිපත් කර ඇති බවත්ය.

**2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2017 වර්ෂයේදි ප්‍රසිද්ධ කළ ආයතනික පාලනය සඳහා උසස් පරිචයන් පිළිබඳ සංග්‍රහයේ උපලේඛනය-1 | 2016 නොවැම්බර් සිට 2017 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා රු.1,170,450 ක් වැටුප් හා වෙනත් දීමනා ලෙස විධායක අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කරනු ලබන අධ්‍යක්ෂවරයෙකුට ගෙවීම් කර තිබුණත් ඔහු විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අඛණ්ඩව සහභාගී වී නොතිබුණු අතර, ඔහුගෙන් සමාගමට අගය එකතු කිරීමක්ද සිදු වී නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් කටයුතුවලින් වූ බදු පෙර ශුද්ධ ලාභය රු.38,385,184 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.807,778 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.37,577,406 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ විකුණුම් රු.31,503,573 කින් සහ වෙනත් ආදායම් රු.2,719,193 කින් වැඩිවීම මෙම වර්ධනය කෙරෙහි බලපෑ ප්‍රධාන හේතු වී තිබුණි.

**3.2 අනුපාත විශ්ලේෂණය**

(අ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධනය යෙදවීම මත ප්‍රතිලාභය (ROCE) සියයට 25.17 කින් ඉහළ ගොස් තිබුණි.

(ආ) ජංගම අනුපාතය පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සියයට 2.14 සිට සියයට 3.98 දක්වා ඉහළ ගොස් තිබූ අතර ක්ෂණික වත්කම් අනුපාතය සියයට 1.64 සිට සියයට 1.89 දක්වාත් ඉහළ ගොස් තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සමාගමේ ඇස්තමේන්තුගත ලුණු නිෂ්පාදනය සහ එයට අනුරූපීව ඇස්තමේන්තුගත ආදායම පිළිවෙලින් මෙට්‍රික් ටොන් 5,500 ක් සහ රු.143,300,000 ක් විය. කෙසේ වුවද, ඉලක්කගත නිෂ්පාදනයෙන් මෙට්‍රික් ටොන් 3,336 ක් හෙවත් සියයට 60 නිෂ්පාදනයක් මගින් රු.93,405,977 ක් තථ්‍ය විකුණුම් ආදායමක් එනම් සියයට 65 ක් නියෝජනය කළ අයවැයගත විකුණුම් ආදායමක් පමණක් ළඟාකරගෙන තිබුණි.

(ආ) වෙළඳපොල සමීක්ෂණයක් හා විකුණුම් ඉලක්කයන් වැනි විධිමත් පදනමක් කෙරෙහි අවධානය යොමු නොකර සමාගම විසින් විටින් විට ලුණුවල විකුණුම් මිල වෙනස් කර තිබුණි. කෙසේ වෙතත්, සමාගම විසින් 2016 සැප්තැම්බර් 14 සිට 2018 මාර්තු 28 දක්වා කාලපරිච්ඡේදය සඳහා මෙට්‍රික් ටොන් එකක් රු.29,075 සිට මෙට්‍රික් ටොන් එකක් රු.9,000 දක්වා 7 වරක් එහි මිල වෙනස් කර තිබුණි. එසේ වුවද, තීරණය කළ මිල යටතේ නිෂ්පාදනයෙන් සැහෙන ප්‍රමාණයක් විකුණා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මිල තීරණය කරන ලද අවස්ථාවේදී පැවැති නිෂ්පාදිතයන් පිළිබඳ විග්‍රහ කිරීමේදී මන්නාරම සහ එලිෆන්ට්පාස් ලුණු ලේවායන්වල පිළිවෙලින් රු.122,930,841 ක සහ රු.17,623,462 ක පාඩු එම කාල වකවානු තුළ සිදු වී තිබුණි.

**4.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

---------------------------------

සමාගම විසින් 2016 වර්ෂයේ සිට ආරක්ෂක සේවාවක් සපයා ගැනීම වෙනුවෙන් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියක් අනුගමනය කර නොතිබූ අතර 2017 අප්‍රේල් 18 සිට 2018 පෙබරවාරි 14 දක්වා කාලපරිච්ඡේදය සඳහා රු.1,424,018 ක් ගෙවා තිබුණි. තවද, කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබූ අතර ආරක්ෂක සේවාව සඳහා විධිමත් පරිදි ලංසු කැඳවීමක්ද සිදුකර නොතිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

-----------------------------------------

**5.1 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්**

-----------------------------------------------

2009 ජුනි 9 දිනැති අංක DMA/2009(I) මඟින් සංශෝධිත 2016 ජනවාරි 28 දිනැති අංක DMA/Cir-edit/2016 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එක් වර්ෂයක් සඳහා අවම වශයෙන් හයක්වත් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පමණක් පවත්වා තිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

-------------------------

සමාගමේ සියළුම කටයුතුවල අභ්‍යන්තර පාලනය සමාලෝචනය කළහැකි අයුරින් සම්පූර්ණ සමාගමම ආවරණය වන ආකාරයේ අභ්‍යන්තර විගණන වැඩසටහන් සමාලෝචිත වර්ෂයේදී පවත්වාගෙන ගොස් නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

---------------------

විගණනය අතරතුරදී අනාවරණය වූ පද්ධති හා පාලන දූර්වලතාවයන් සමාගමේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
| --- | --- |
| (i) ලුණු නිෂ්පාදනය ගබඩා කිරීම හා විකිණීම | නිෂ්පාදනය විකිණීම සහ ගබඩා කිරීම කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. |
| (ii) මූල්‍ය පාලනය | ස්ථාවර තැන්පතු ආපසු ගැනීමේදී සහ මුදල් ප්‍රවාහ කළමනාකරණයේදී විධිමත් පාලන පටිපාටියක් අනුගමනය කර නොතිබුණි. |